දැයට කිරුළ

# රක්ෂණ යෝජනා පත්‍රයක් (Insurance Proposal Form) සම්පූර්ණ කිරීමේදී සැලකිලිමත් වන්න!




ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

රක්ෂණ කර්මාන්තයේ නියාමන ආයතනය

(මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකයි)

IBSL
INSURANCE BOARD OF SRI LANKA

දැයට කිරුළ

- **රක්ෂණ යෝජනා පත්‍රයක් (Insurance Proposal Form) යනු කුමක්ද?**

මෙය, රක්ෂණ ආවරණයක් ලබාගැනීමට ප්‍රථමයෙන් රක්ෂණ සමාගම විසින් ආවරණය අවශ්‍ය පුද්ගලයකු වෙනුවෙන් හෝ දේපළක් වෙනුවෙන් විස්තර ඉල්ලා සිටින ඉල්ලුම් පත්‍රයකි. මෙය සම්පූර්ණ කිරීමේදී අදාල කරුණු සියල්ල එළිකළ යුතු අතර සත්‍ය තොරතුරු සඳහන් කළ යුතුය. යෝජනා පත්‍රය පුරවා ආවරණය ලබාගන්නා අය විසින් අත්සන් කළ යුතුය.

- **යෝජනා පත්‍රයක සම්පූර්ණ සත්‍ය කරුණු ඇතුලත් කළ යුත්තේ ඇයි?**

රක්ෂණ සමාගමක් යම් පුද්ගලයකුට දෙනු ලබන ආවරණය කුමක්ද යන්න තීරණය කරනු ලබන්නේ රක්ෂණ යෝජනා පත්‍රයේ අඩංගු කරුණු ආශ්‍රයෙනි. අසත්‍ය කරුණු ඇතුලත් කිරීමෙන් තමන්ට අවශ්‍ය කරන නිසි ආවරණය කුමක්ද යන්න තීරණය කිරීම අපහසු වේ. රක්ෂණ සමාගමක් තම සේවය රක්ෂණලාභීන්ට ලබා දෙන්නේ ඔවුන් විසින් ලබාදෙන කරුණු මත "උපරිම විශ්වාසය" තබාගෙනය. මෙම උපරිම විශ්වාසය කඩකිරීම මත රක්ෂණ හිමිකමක් ගෙවීම ප්‍රතික්ෂේප කළ හැකිය.

- **රක්ෂණ යෝජනා පත්‍රයක අසත්‍ය කරුණු ඇතුලත් කර ඇති අවස්ථාවක සිදුවන්නේ කුමක්ද?**

යෝජනා පත්‍රයක නොදැනුවත්කමින් හෝ සිතාමතා හෝ අසත්‍ය කරුණු ඇතුලත් කර ඇති අවස්ථාවක රක්ෂණ සමාගමක් විසින් රක්ෂණ හිමිකමක් ලබා දීම ප්‍රතික්ෂේප කළ හැක. එසේම එම රක්ෂණ ඔප්පුව අවලංගු කිරීමද කළ හැක.

IBSL
INSURANCE
BOARD OF SRI LANKA

දැයට කිරුළ

- **අසත්‍ය කරුණු ඇතුලත් කර ඇති බව දැනගත හැක්කේ කෙසේද?**

රක්ෂණ හිමිකමක් ගෙවීමට ප්‍රථමයෙන් ඒ සම්බන්ධයෙන් අදාල සමාගම විමර්ශනයක් සිදු කරයි. මෙම විමර්ශනයේදී සියළු තොරතුරු ලබා ගත හැකිය. රෝගියකු හෝ මියගිය කෙනෙකු වෙනුවෙන් හිමිකම් ඉල්ලා සිටින අවස්ථාවක අදාල වෛද්‍ය වාර්තා පරීක්ෂා කිරීමෙන් විස්තර ලබා ගත හැකිය. මේවායින් සත්‍ය තොරතුරු එළිකර ගත හැක.

- **රක්ෂණ යෝජනා පත්‍රයේ අසා ඇති කරුණු අපැහැදිලි නම්...**

රක්ෂණ යෝජනා පත්‍රයක අසා ඇති කරුණු හොඳින් පැහැදිලි කරගන්න. අපහැදිලි කරුණු සඳහන් රක්ෂණ යෝජනා පත්‍රයක් අත්සන් කිරීමෙන් ඔබ අනවශ්‍ය අවදානමකට මුහුණ දෙයි. රක්ෂණ හිමිකමක් ගෙවීමේදී යෝජනා පත්‍රයේ ඇතුලත් කර ඇති කරුණු පදනම් කරගෙන ගෙවීම් කරනු ලැබේ. තමන් වෙනුවෙන් රක්ෂණ නියෝජිතයකු යෝජනා පත්‍රය සම්පූර්ණ කරන අවස්ථාවක එහි අත්සන් කිරීමට පෙර නැවත වරක් හොඳින් කියවා බලන්න.

- **සැලකිලිමත් විය යුතු වෙනත් කරුණු ...**
  - රක්ෂණ යෝජනා පත්‍රයක් තමන් කැමති භාෂාවකින් ඉල්ලා සිටිය හැක.
  - රක්ෂණ යෝජනා පත්‍රයට අත්සන් කිරීම අත්‍යවශ්‍යය, වෙනත් කෙනෙකු එය පුරවන්නේ නම් තමා එය කියවා බලා සෑහීමකට පත්ව අත්සන් කරන්න.
  - කිසිවිටකත් සම්පූර්ණ නොකරන ලද හිස් රක්ෂණ යෝජනා පතකට අත්සන් කිරීමෙන් වලකින්න.

IBSL
INSURANCE BOARD OF SRI LANKA

## පනත යටතේ රක්ෂණ කර්මාන්තයේ නියැලීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් ලියාපදිංචිකර ඇත්තේ පහත සඳහන් සමාගම් පමණි. (ඉංග්‍රීසි ආකාරාදි පිළිවෙළට දක්වා ඇත)

| | නම | වර්ගය |
|---|---|---|
| 01 | ඇලියොන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 02 | ඇලියොන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | ජීවිත රක්ෂණය |
| 03 | අමානා තකාෆුල් පි එල් සී | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 04 | ඒෂියන් එලයන්ස් ඉන්ෂුවරන්ස් පි එල් සී | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 05 | අවිවා එන් ඩි බි ඉන්ෂුවරන්ස් පි එල් සී* | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 06 | සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පි එල් සී | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 07 | සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ්** | සාමාන්‍ය රක්ෂණය |
| 08 | චාටිස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්*** | සාමාන්‍ය රක්ෂණය |
| 09 | කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 10 | කෝපරේට්ව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 11 | එච් එන් බි ඇෂුවරන්ස් පි එල් සී | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 12 | ජනශක්ති ඉන්ෂුවරන්ස් පි එල් සී | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 13 | ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ් | ජීවිත රක්ෂණය |
| 14 | එල් ඕ එල් සී ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 15 | එම් බි එස් එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 16 | පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 17 | සීමාසහිත සණස රක්ෂණ සමාගම | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 18 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 19 | යුනියන් ඇෂුවරන්ස් පි එල් සී | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |

* රීගල් ඉන්ෂුවරන්ස් පී එල් සී ලෙස කලින් හැඳින්විය.

** දැනට මෙම සමාගමේ කටයුතු මණ්ඩලයේ විමර්ශනයට ලක් වී ඇත.

*** [illegible] හේලීස් ඒ අයි ජී ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් ලෙස කලින් හැඳින්විය.

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය
11 වන මහල, නැගෙනහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.
දුරකථන : 011 2396 184-9, ෆැක්ස් : 011 2396 190
ඊ-මේල් : info@ibsl.gov.lk, වෙබ් : www.ibsl.gov.lk